# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2331/08 - 2023 මැයි මස 08 වැනි සඳුදා - 2023.05.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය - DSM/NU/LND/7/23/iv

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය - 4-3/10/2020/MV/288-B

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් අත්කර ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

මෙහි මහජන කටයුත්ත යනු වයඹ පළාත් ඇළ ව්‍යාපෘතියට අදාළ බෝවතැන්න උමං මාර්ගය සහ නිර්මිත ඉදිකිරීම සඳහා ඉඩම් කොටස්වල පරවශ්‍යතාවය අත්කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක ඊ 410 ඒ අරංගල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පෙනලබොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2023.04.27 වැනි දින සම්මත කරන ලද ක.සි. අංක 310213, කලාප අංක අංක 05 හා පත්‍ර අංක 1 හි පහත සඳහන් කර ඇති කැබලි 1, 2 සහ 3 දක්වා (උප ලේඛනයේ සඳහන් කර ඇත.)

01. කැබලි අංක 1

ඉඩමේ නම: උඩළිඳමුකලාන කන්දේයාය, පිහිල්ලේ මුකලාන, පනහවැල්ලගහ මුකලාන, කුඹිබිලියහේන, මහපතනේමුකලාන,හීන්දඹගොල්ලමුකලාන, අරංගලමුකලාන සහ මහමුකලාන; විස්තරය: කැලෑව; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.4070.

02.කැබලි අංක 2

ඉඩමේ නම: අරන්ගල වත්ත; විස්තරය: ලඳු කැලෑව; හිමිකම් කියන අය: පෞද්ගලික හිමිකම් කියන්නා සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.1757.

03. කැබලි අංක 3

ඉඩමේ නම: අරන්ගල වත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: වීරහැන්නේදිගේ නිශාන්ත ප්‍රියලාල් ප්‍රනාන්දු; ප්‍රමාණය: හෙක්. 0.0192.

ඉහත සඳහන් ඉඩම් කැබලි සඳහා හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2023.05.24 වැනි දින පෙ.ව. 10.00 ට නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2023.05.17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත්,

එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 2 ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එස්.විජයකුමාර්
ප්‍රාදේශිය ලේකම්,
නාඋල

2023 මැයි මස 02 වැනි දින
නාඋල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 05-0024

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය - DSM/NU/LND/7/23/ Vii
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය - 4-3/10/2020/MV/288-F

මහජන කටයුත්තක් සඳහා අවශ්‍යා පහත දැක්වෙන ඉඩම් අත්කර ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ හෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

මෙහි මහජන කටයුත්ත යනු වයඹ පළාත් ඇළ ව්‍යාපෘතියට අදාළ බෝවතැන්න උමං මාර්ගය සහ නිර්මිත ඉදිකිරීම සඳහා ඉඩම් කොටස්වල පරවශතාවය අත්කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, නාඋල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ අංක ඊ 410බී පිළිහුඩුගොල්ල පහළ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිළිහුඩුගොල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2023.03.15 දින සම්මත කරන ලද කැ.සි. අංක 310220, කලාප අංක අංක 01 හා පත්‍ර අංක 1 හි පහත සඳහන් කර ඇති කැබලි 1, 2 සහ 3 දක්වා (උප ලේඛනයේ සඳහන් කර ඇත.)

**01. කැබලි අංක 1**
ඉඩමේ නම: වලස්හේන සහ මීගොල්ල කැලේ (මීගොල්ල වන රක්ෂිතය); විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මහගෙදර ගුණරත්න විසින් අනවසරයෙන් වගා කර ඇත; ප්‍රමාණය: හෙක්. 0.0067.

**02. කැබලි අංක 2**
ඉඩමේ නම: වලස්හේන සහ මීගොල්ල කැලේ (මීගොල්ල වන රක්ෂිතය); විස්තරය: කැලෑව; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.4171.

**03. කැබලි අංක 3**
ඉඩමේ නම: වලස්හේන; විස්තරය: ලඳු කැලෑව; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0248.

ඉහත සඳහන් ඉඩම් කැබලි සඳහා හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලයලත් අයවළුන් හෝ 2023.05.24 වැනි දින පෙ.ව. 10.00 ට නාඋල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2023. 05.17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 2 ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එස්.විජයකුමාර්
ප්‍රාදේශිය ලේකම්,
නාඋල

2023 අප්‍රේල් මස 24 වැනි දින
නාඋල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 05-0025

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.